# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,258 - 2021 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා - 2021.12.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2430 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2433 |

*සැ. යු.*- (i) වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 දෙසැම්බර් මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 දෙසැම්බර් මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2427 - B 82295 — 5,403 (2021/12)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම - 2021

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවා කොන්දේසි* :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලටද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධානවලට ද, ''ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්'' තනතුරට තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු යටත් වන්නේය.

2.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදළ වන 12.18 වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති හා/හෝ ඉදිරියේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. වැටුප :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට අදාල වැටුප් පරිමාණය.

SL 1-2016(මාසික) රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630- 17 x 2,170 - රු. 110,895 ක් වේ.

(මෙම තනතුරට හිමි ආරම්භක වැටුප SL1-2016 වැටුප් පරිමාණයේ 12 වන පියවර වේ. ඒ අනුව ආරම්භක වැටුප රු. 62,595 කි.) පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

05. *සුදුසුකම්* :

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම,

සහ

(*ආ*) 2021.12.10 දිනට වයස අවු. 30 ට නොඅඩු සහ අවු. 45 ට නොවැඩි වීම,

සහ

(*ඇ*) අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු වීම හෝ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I වැනි ශ්‍රේණියේ වසර 07 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකු වීම සහ එම තනතුරක ස්ථිර කර තිබීම,

හෝ

(*ඈ*) අවුරුදු 07 කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදී සිටින නීතිඥවරයෙකු වීම.

*සටහන* :-

I. යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නීතිඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නෛතික තත්ත්වයෙන් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් සේවය කරන ලද කාලපරිච්ඡේදයක් ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි කාලපරිච්ඡේදයක් වශයෙන් සලකනු ලැබේ.

II. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිරත නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(*ඉ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(*ඊ*) තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

සැ. යු.- සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2021 දෙසැම්බර් මස 10 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. මූලික සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව තනතුර සඳහා සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

07. තනතුර සඳහා බඳවාගනු ලැබූයේ ඉහත 05 (ඇ) යටතේ වූ සුදුසුකම් සපුරන ලද නිලධරයෙකු නම්, මෙම තනතුරට පත්වීමේ දින සිට වසර එකක වැඩ බැලීමේ සේවා කාලයකට යටත් වන්නේය. තනතුර සඳහා බඳවාගනු ලැබූයේ ඉහත 05 (ඈ) යටතේ වූ සුදුසුකම් මත නම්, එසේ තනතුරට පත්වූ නිලධරයකු පත්වීමේ දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

08. තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරී නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හෝ පත් කරන ලද තනතුරෙහි රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවකුගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

09. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්*
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවෙකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) අයදුම්පත්‍ර ගාස්තුව රු. 500 කි. මෙම මුදල ''අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්'' නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යනු ලබන ගිණුම් අංක 297100199025039 ට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්කරුගේ නම ලිපිනය ලියන ලද අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග ලියාපදිංචි තැපැල් මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ භාරදීමෙන් අයදුම්පත ලබාගත හැකිය. මුදල් ගෙවීම සඳහා අදාල ලදුපත සම්පූර්ණ කිරීමේදී ලදුපතේ අදාල ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2022.01.10** දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ''ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12'' යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත භාරදීම කළ යුතුය.

11. (*අ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ, තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(*ආ*) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(*ඇ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

12. මෙහි ඉහත 01 සිට 11 දක්වා ඡේද/වගන්තීන්වල විධිවිධාන සලසා නොමැති කරුණක් වෙතොත් ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරනු ඇත.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2021 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

12-379

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

**සැ. යු.-** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුව I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2022 ජනවාරි මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 දෙසැම්බර් මස 01 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | කොත්මලේ | පල්ලෙපනේ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කොත්මලේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

12-405

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 වර්ෂය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන යටතේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ මෙහි පහත I වැනි වගන්තියේ සඳහන් තනතුරු 162 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම්, අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත, අයදුම්කරුගේ අත්සන සහතික කර අදළ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් බාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ. වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සටහන් කළ යුතුය.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2021.12.13** දින **පෙ. ව. 8.00** ට විවෘත වේ.

අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේදී නැති වූ බව හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් විඳදරාගත යුතුය.

***සටහන*** : අංක 1929 දරන හා 2015.08.21 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම් මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. පෙර නිවේදනයේ සඳහන් දිනට සුදුසුකම් සම්පූර්ණ කර සිටි අපේක්ෂකයින් සඳහා මෙම නිවේදනයේ 5.3 යටතේ සඳහන් උපරිම වයස් සීමාව අදළ නොවේ. මෙහිදී ඔවුන් නැවත විභාග ගාස්තු ගෙවීමද අවශ්‍ය නොවේ. කලින් අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත.

මෙම නිවේදනයේ ''ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය'' යන්නෙන් අංක 1880/26 දරන හා 2014.09.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා මෙතෙක් එයට සිදුකර ඇති හා ඉදිරියට සිදු කරනු ලැබිය හැකි සියලු සංශෝධන අදහස් වේ. ''පත්කිරීම් බලධරයා'' යන්නෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද ''ලේකම්'' යන පදයෙන් ''කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්'' ද ''සේවය'' යන්නෙන් ''ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය'' ද ''පත්වීම'' යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්වීමක් ද'' ලිඛිත විභාගය '' යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 ද වෙනත් ආකාරයකින් විස්තර නොවේ නම් ''නිලධාරියා'' යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරියකු/නිලධාරිනියක ද අදහස් වේ.

අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය **2022.01.10** වේ.

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022 මාර්තු මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

1. *තනතුරු හා පුරප්පාඩු සංඛ්‍යාව* :

| *ධාරාව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *තනතුරු කේතය* |
|---|---|---|---|
| කෘෂි සංවර්ධන | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) | 69 | 1 |
| කෘෂි පර්යේෂණ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) | 88 | 2 |
| කෘෂි ආර්ථික විද්‍යා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 05 | 3 |

***සටහන.-***

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවකුට කෘෂි සංවර්ධන, කෘෂි පර්යේෂණ, කෘෂි ආර්ථික විද්‍යා යන ධාරාවන්ගෙන් එකකට වැඩි ගණනකට එකම අයදුම්පත මගින් අයදුම් කළ හැකිය.

2. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

2.1 *ලිඛිත විභාගය* :-

ලිඛිත විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර විෂය නිර්දේශය මෙම නිවේදනයේ පළමු පරිශිෂ්ටයේ දැක්වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය (පැය)* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 1 1/4 | 100 | 40 |
| විෂයානුබද්ධ අධ්‍යයනය (අදළ තනතුරට අනුව) | 2 | 100 | 40 |

2.2 ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.

2.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ;*

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලකුණු වල කුසලතා අනුපිළිවෙල පදනම් කරගෙන පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි සංඛ්‍යාවක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, අයදුම්කරුවන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සහ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නියමිත දිනට සපුරා ඇති ද යන්න සනාථ කර ගැනීම පමණක් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ඇත.

2.4 ඉහත තනතුරු එකකට වැඩි ගණනකට අයදුම්කොට, එකී තනතුරු කිහිපයක් සඳහා තෝරාගනු ලැබීමට සුදුසුකම් ඇතිව, ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන ඇති අයදුම්කරුවන්, ඔවුන්ගේ ලිඛිත විභාග යේ ලකුණුවල කුසලතාව හා තනතුරුවලට ලබාදෙන මනාප අනුපිළිවෙල සැලකිල්ලට ගෙන තනතුරකට තෝරාගනු ලැබේ. එවැනි අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී තනතුරු සඳහා වූ තම මනාප අනුපිළිවෙළ ලිඛිතව ලබාදිය යුතු අතර, එය කිසිම හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

2.5 සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර වාර්තා කළ පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදාළ එක් එක් තනතුර සඳහා සුදුසුකම් සනාථ කර ගනු ලබන අයදුම්කරුවන් අතුරින් ලිඛිත විභාගයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ පමණක්ම පදනම් කරගෙන තෝරාගනු ලබන අයදුම්කරුවන් එක් එක් තනතුරෙහි පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

3. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා කොන්දේසි* :-

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද නිලධාරියකු නම් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ද නිලධාරිනියක නම් වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයටද දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

3.2 තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

3.3 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් සේවයේ අවශ්‍යතාව අනුව පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් ය. මේ සඳහා නිලධාරියකු පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීමට තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකිය. නිලධාරියකු පළාත් රාජ්‍ය සේවයේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාව අනුව පත් කිරීමේ රාජ්‍ය සේවා බලධරයා සහ අදළ පළාත් බලධරයා අතර ඇති කර ගනු ලබන එකඟතාවය අනුවය.

(අ) සේවයෙන් මුදා හැරීමේ කොන්දේසිවලට යටත්ව පළාත් රාජ්‍ය සේවයේ තනතුරට පත්වීම් ලිපියක් පළාත් බලධරයා විසින් අදළ නිලධාරියා වෙත නිකුත් කරනු ඇත. නිලධාරියා අදාළ පළාත් බලධරයා විසින් පළාත තුළ ස්ථාන මාරු කිරීම් කරනු ලැබීමට යටත් වනු ඇත.

(ආ) පළාත් රාජ්‍ය සේවයේ නිරත කාලය තුළදී වුවද නිලධාරියකු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට සහ විනය පාලනයට යටත්වනු ඇත.

(ඇ) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදා හරින ලද කාලය අවසානයේ දී නිලධාරියා නිත්‍ය සේවයට ආපසු පැමිණිය යුතු ය.

3.4 විවෘත බඳවා ගැනීමේ ධාරාව යටතේ බඳවා ගනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් වන අතර පත්වීම ස්ථිර කිරීමට පෙර ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු වේ.

3.5 *නිපුණතා සංවර්ධනය*.-සේවයට බඳවාගත් නිලධාරීන් සඳහා කෘෂිකාර්මික සංවර්ධනයට අදළ සමාජ, ආර්ථික, සංස්කෘතික හා රාජකාරී කරන පරිසරයේ ඇති ප්‍රවණතාවන් පිළිබඳ නිපුණතාවයක් ලබා ගැනීමට අවශ්‍ය පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හෝ දෙපාර්තමේන්තුව හඳුනගන්නා වෙනත් ආයතනයක් විසින් (*උදා*.- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) මාසයක (01) පුහුණු පාඨමාලාවක් තුළින් ලබා දෙනු ඇත. පාඨමාලාව අවසානයේ කරනු ලබන ඇගයීමකින් පසු සහතිකයක් නිකුත් කරනු ලැබේ. සේවයේ ස්ථිර කිරීමට මෙම සහතිකය ලබාගත යුතු ය.

3.6 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසිවලට ද අංක 1589/30 දරන සහ 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද (මින් මතුවට කාර්ය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන) ඉහත නියමයන්, කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දැනටමත් කර ඇති හෝ මින්මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

3.7 පත්වීම්ලාභීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත කාලය තුළ අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

04. *මාසික වැටුප් පරිමාණය* :

මෙම තනතුරුවලට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව හිමි ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි වේ.

SL-01-2016-රු. 47,615 - 1,335 x 10 - 1,630 x 8 - 2,170 x 17 - රු.110,895

පත්වීම්ලාභීන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවර වන රු. 47,615 හි පිහිටුවනු ඇත.

05. *සුදුසුකම්* :

5.1 අධ්‍යාපන සුදුසුකම් :

5.1.1 කෘෂි සංවර්ධන ධාරාව සහ කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම.

5.1.2 කෘෂි පර්යේෂණ ධාරාව සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ව විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම;

5.2 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

5.3 වෙනත් සුදුසුකම් :-

(අ) සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය. ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2000.01.10 දින හෝ ඊට පෙර හා 1992.01.10 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

(ඇ) එක් අයදුම්කරුවකුට උපරිම වශයෙන් අවස්ථා **තුනක්** පමණක් විවෘත තරග විභාගයට පෙනී සිටිය හැකිය.

(ඈ) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, ඒ බව වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කළ යුතුය.

(ඉ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඊ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය. (විවෘත බඳවා ගැනීම් සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාගයට අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙසට නියම කර ඇති උපාධි සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. මේ සඳහා උපාධි සහතිකයේ වලංගු දිනය, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතුය. නිර්දේශිත සුදුසුකම් සම්පූර්ණ කිරීමට අදාළව ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් වලංගු නොවේ.)

06. විභාග ගාස්තු :-

විභාග ගාස්තු රු. 1200 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
(iv) ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Slip Payment)
(v) තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at any Post office).

ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ විද්‍යුත් තැපැල මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

**සටහන.**-ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

07. විභාගයට අයදුම් කිරීම පිළිබඳ උපදෙස් :-

7.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට විභාග දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව /භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E- mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම්කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.2 අයදුම්පතේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

08. විභාගයට පෙනී සිටීම :-

8.1 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ දී ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපත හා අයදුම්පත තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකය ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීමද වඩාත් ප්‍රතිඵලදායි වනු ඇත.

8.2 අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී තමාට හිමි විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. තමාට පෙනී සිටීමට හිමි විභාගයේ නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සෑම අපේක්ෂකයකුගේම වගකීමකි. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8.3 අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු/ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව :-

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. විභාග ක්‍රමය :-

10.1 *විභාග මාධ්‍යය :*
විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.2 අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු ලිවිය යුතුය.

11. තරඟ විභාග පටිපාටිය හා අදාළ විෂයය නිර්දේශය :

සියලුම අයදුම්කරුවන් මෙහි මතු දැක්වෙන විෂය නිර්දේශයට අනුකූලව 1 වන හා 2 වන ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතුය.

එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශය පළමු පරිශිෂ්ටයේ දැක්වේ.

12. ප්‍රතිඵල නිකුත් කිරීම :-

පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි සංඛ්‍යාවක් වූ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබාදෙනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලද පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව ලබාදීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියෙහි පළ කිරීම හෝ සිදුවනු ඇත.

13. අයදුම්පතට සහතික කිසිවක් අමුණා නොඑවිය යුතුය. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අවස්ථාවේ දී පමණක් ඔවුන් තම අයදුම්පතේ සඳහන් කර ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල මුල් ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

14. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකුට මෙම තරඟ විභාගයට මුහුණ දීම සඳහා සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාග යට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇති බව හෝ පත්වීම් දීමට පසුව හෙළි වුවහොත් එය ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

15. මෙහි විධිවිධාන සලසා නැති කුමන හෝ කරුණක් පිළිබඳ අවසන් තීරණය පත්වීම් බලධාරියා විසින් ගනු ඇත.

16. පවතින පුරප්පාඩු සියල්ල හෝ ඉන් කොටසක් හෝ පිරවීම/නොපිරවීම පිළිබඳ අවසන් තීරණය ගනු ලබන්නේ පත්වීම් බලධාරියා විසින් ය.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයන්හි භාෂා පාඨ අතර යම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ,
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
අංක 80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

පළමු පරිශිෂ්ටය

විවෘත තරඟ විභාග රෙගුලාසි හා විෂයය නිර්දේශය

*1 වැනි ප්‍රශ්න පත්‍රය - බුද්ධි පරීක්ෂණය*

භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා වන ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න /කෙටි ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 1 1/4 කි. මුළු ලකුණු සංඛ්‍යාව 100 කි.

*2 වැනි ප්‍රශ්න පත්‍රය - විෂයානුබද්ධ අධ්‍යයනය*

මෙය නියම කර ඇති විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන තනතුරට අදාළ ලිඛිත අභියෝගතා පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවකු විසින් තමන් අයදුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදළ වන පරිදි පහත සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරාගනු ලබන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට අවකාශ ඇත. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත වේ. කාලය පැය 2ක් වන අතර, මුළු ලකුණු සංඛ්‍යාව 100ක් වේ.

**සටහන.**-පහත සඳහන් විෂය නිර්දේශය අනුව විවෘත විභාගයේ දී විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය න්‍යායාත්මක දැනුමට වැඩි නැඹුරුවක් වන සේ සකස් කරනු ලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ආකාරයට විභාගය පවත්වනු ලැබේ.

එක් එක් තනතුරට අදළ විෂය නිර්දේශය පහත දැක්වේ.

1. කෘෂි පර්යේෂණ ධාරාව සඳහා විෂය නිර්දේශය :

අයදුම්කරුවන්ගේ මනාපය පරිදි පහත (අ) සහ (ආ) අතරින් එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

**(අ) කොටස**

01. **කෘෂිකාර්මික උද්භිද විද්‍යාව :**
බෝගවල වර්ගීකරණ මූලධර්ම, බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම

02. **ප්‍රවේණි විද්‍යාව හා ශාක අභිජනනය :**
මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති අනුක ප්‍රවේණිය, සෛල ප්‍රවේණි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය, පරාගනය සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් පේළි වරණය, බහුලව භාවිත වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව.

03. **ශාක ව්‍යාධි විද්‍යාව :**
ව්‍යාධි ජනක ජීවී කාණ්ඩ, ආසාදන, ඒවාට පැළෑටි දක්වන සංවේදිතාව, ආසාදන ආකාර, මේවා පාලනයේ මූලධර්ම, ශාක ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳව වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණික ක්‍රම, රෝග ලක්ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය, රෝග විනිශ්චයේ නව තාක්ෂණ ක්‍රම (ELISA) හා වර්තමාන නැඹුරුව.

04. **කීට විද්‍යාවේ මූලධර්ම :**
සත්ත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම.

05. **බීජ තාක්‍ෂණය :**
බීජ කායික විද්‍යාව, බීජයක ව්‍යුහය, සුප්තතාව, ප්‍රරෝහණය, ජීව්‍යතාව, බීජ පරීක්ෂණ සහ පාරිශුද්ධතාව සඳහා පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

06. **පටක විද්‍යාව :**
මූලධර්ම, පටක විද්‍යාවේ පහසුකම් හා අවශ්‍යතාව, මාධ්‍යයන්, පටක විද්‍යා රෝපණ ක්‍රම භාවිත කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපණය, විකෘති බිහිවීම, කලල බේරා ගැනීම, නලස්ථ සංසේචනය, ජානයේ පරිණාමය, ප්‍රාක් සංරක්‍ෂණය.

07. **කෘෂිකාර්මික රසායන විද්‍යාව :**
ජීව රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේදී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, ආහාර රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ප්‍රායෝගික භාවිතයන්

හෝ

(ආ) කොටස

01. **ශෂ්‍ය විද්‍යාව :**
කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංවර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, බෝග වර්ධන මිනුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදන ක්‍රමවල මූල ධර්ම, බෝග පාංශු හා ජල සම්බන්ධතාවයේ මූලධර්ම.

02. **බෝග විද්‍යාව :**

වී, උස් බිම් ධාන්‍ය, මාෂ බෝග, අල බෝග හා අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල කායික විද්‍යාව, වර්ධන ප්‍රචාරණ ක්‍රම, රෝපණ ක්‍රම, බෝග පාලනයේ භෞතික, රසායන හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම් ඇති කිරීම හා ඒවා පාලනය, දුව නිෂ්පාදන හා පළතුරු නිෂ්පාදන මූලධර්ම.

03. **පාංශු විද්‍යාව :**
පස නිර්මාණය, පසක භෞතික හා රසායනික ගති ලක්ෂණ, බෝග වගාවට අදාළව පසෙහි ඇති ගැටලු, පසෙහි සාරවත් බව පාලනය, ජල පෝෂක පාලනය, පැළෑටි පෝෂණය, පැළෑටි වර්ගීකරණ මූලධර්ම.

04. *ප්‍රවේණි විද්‍යාව හා පැළෑටි අභිජනනය:*

මූලධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති, අනුක ප්‍රවේණි විද්‍යාව, සෛල ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය

05. *පැළෑටි ව්‍යාධි විද්‍යාව :*

පැළෑටි ආසාදන, ආසාදනවලට පැළෑටිවල සංවේදිතාව, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවණතා

06. *කීට විද්‍යා මූලධර්ම :*

(අ) ප්‍රශ්න පත්‍රයේ 04 උපඡේදය යටතේ දක්වා ඇති කොටස මීට අදාළ වේ.

07. ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා මූලධර්මයන් (Statistical Principles) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි වැදගත් සංඛ්‍යාලේඛන පිළිබඳ දැනුම.

08. *කීට විද්‍යාව :*

කෘෂිකර්මයේ දී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර සහ අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධතිවල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යයන්, පළිබෝධ පාලනය, පළිබෝධ හානිවල වැදගත්කම, පළිබෝධ හඳුනා ගැනීම, ඔවුන්ගේ හානිය හා පාලනය, ඒකාබද්ධ පළිබෝධ පාලනය.

09. *ක්ෂුද්‍ර ජෛව විද්‍යාව :*

ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂි කර්මාන්තයට ඔවුන්ගේ බලපෑම.

10. *ජීවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යානය :*

සංඛ්‍යානය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැලසුම් විශ්ලේෂණ, දත්ත ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

*සටහන* : විවෘත බඳවා ගැනීම් තුළින් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුරුවලට අයදුම් කරනු ලබන සියලුම අපේක්ෂකයින් ඉහත (අ) හෝ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් කවර හෝ එක් කොටසකට පමණක් පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

## II. කෘෂි සංවර්ධන ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය

01. *සාමාන්‍ය කෘෂිකර්මය :*

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංවර්ධනය, භූමි සැකසීම හා ආම්පන්න, බෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර, පස හා පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලනය, රෝපණ ද්‍රව්‍ය, පළිබෝධ පාලනය, පැළෑටි සංරක්ෂණය, උපකරණ, බෝග වගා ක්‍රම, ජලසම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල

සම්පාදන ක්‍රම, අස්වැන්න නෙළීම හා අස්වැන්න නෙළන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපළ නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගා කිරීමට සුදුසු එළවළු වර්ග, පලතුරු, පියළි බෝග සහ ධාන්‍ය තෝරාගැනීමේ දී සැලකිය යුතු කරුණු, ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත.

02. *බෝග නිෂ්පාදනය :*
ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණික කලාප සහ පරිසරය, භූමි සංවර්ධනය සහ බිම් සැකසීම, බෝගවල වැඩීමේ මූලධර්ම සහ පැළෑටි භෞතවේදය, බෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක, පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව සහ පාලනය, ජලසම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, බෝග හා ජලය අතර සම්බන්ධතාවේ මූලධර්ම.

03. *ක්ෂේත්‍ර බෝග :*

හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවන්, ශාක විශේෂ හා ප්‍රභේද පැළෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී බෝගයේ ශෂ්‍ය විද්‍යාව, බෝග පාලනය හා නිෂ්පාදනය, උස් බිම් ධාන්‍ය, රනිල, අල බෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර බෝග (දුම්කොළ, උක්, කෙඳි බෝග සහ තෙල් බෝග)

04. *බෝග පාලනය :*

අතුරු බෝග වගාව, අස්වැන්න නෙළීම හා සැකසීම

05. *උද්‍යාන බෝග නිෂ්පාදනය :*

පලතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සාමාජීය හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවන්, වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

06. *පලතුරු, එළවළු හා මල් නිෂ්පාදනය :*

තවාන් පාලනය, උද්‍යාන පාලනය, බෝග ආශ්‍රිත නව තාක්ෂණයන් හා වගා ක්‍රම, පලතුරු හා එළවළු බෝග වැඩි දියුණු කිරීම, පලතුරු හා එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පලතුරු හා එළවළුවල පසු අස්වනු හානි වළකා ගැනීම, ජෛව තාක්ෂණය, පලතුරු හා එළවළුවලට දේශීය හා විදේශීය වෙළෙඳපොලවල, නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවන්, එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, අලෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රචාරණ තාක්ෂණය, වගා ක්‍රම, ප්‍රශස්ත පරිමිති, භූමි අලංකරණ මූලධර්ම.

07. *කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුව :*

කෘෂිකර්ම ව්‍යාප්තිය අර්ථ දැක්වීම හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අනුවර්තනය හා නව්‍යතා විසරණය, සන්නිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශ, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාව, ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, සමාලෝචන ඇගයීම, ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන, වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ ක්‍රියාවලිය, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට භාවිත කෙරෙන විවිධ ක්‍රම, පාඩම් සැලසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

08. *බීජ තාක්ෂණය :*

බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ප්‍රරෝහණ ශක්තිය, බීජ පරීක්ෂා කිරීම, බීජ ප්‍රරෝහණ ශක්තිය හා පාරිශුද්ධතාව පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම. බීජ ගබඩා කිරීම.

09. *මී මැසි පාලනය :*

මී මැසි ගණාවාසයක මී මැසි වර්ග හා වද වර්ග , මී මැසි පෙට්ටිවල කොටස්, මී මැසි ගණාවාස අල්ලා ගැනීම, තැන්පත් කිරීම, කට්ටි බෙදීම, මී මැසි ගණාවාසයක රෝග හා පළිබෝධ.

## III කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය

01. *කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපළ පාලනය :*

කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී ගොවිපළ පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍රත්වරණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාව හා පිරිවැය අවම ප්‍රමාණයට අවදානම පිළිබඳ මූල ධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිචාපක, කෘෂිකර්මයේ ඇති අවදානම හා අඩමානයට මුහුණ දීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ නැමියාව හා විවිධාංගීකරණය, කෘෂිකාර්මික මිල නියම කිරීමට අදාළ වන පරිදි මිල න්‍යාය, බෝග සහ සත්ත්ව සංයෝග අගය කිරීම, ගොවිපළ ප්‍රමාණය හා පරිමාණකුල ඵල, පවුල් ගොවිපළ වැදගත්කම හා සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපළ යාන්ත්‍රීකරණයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේ දී වාර්තාවල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුළත් කිරීම.

02. *කෘෂිකාර්මික අලෙවිය :*

අලෙවි කිරීමේ මූලධර්ම, නිෂ්පාදනයේ හා අලෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අලෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අලෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහි ලා එවැනි ආයතනයක කාර්යභාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු හා අලෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ මූල ධර්ම.

03. *ඉඩම් ආර්ථික විද්‍යාව :*

ආර්ථික විද්‍යාත්මක සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩ සටහනේ වැදගත්කම.

## කම්කරු අමාත්‍යාංශය

### කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 වර්ෂය

කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුරේ පවතින පුරප්පාඩු 59ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත කම්කරු නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට, එනම්, 2022.01.20 වැනි දිනට පහත 02 වැනි හා 03 වැනි ඡේදයන්හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ අදාළ කොටස් සම්පූර්ණ කර, අයදුම්කරුගේ අත්සන සහතික කර අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙම විභාගය 2022 වර්ෂයේ අප්‍රේල් මස කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ.

*සටහන 1* :

අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගනු ලැබේ.

02. *සුදුසුකම්* :

2.1 *අධ්‍යාපන සුදුසුකම්* :

(*අ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

*හෝ*

(*ආ*) ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයකු වීම.

2.2 *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා සෑම අයුරකින් ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.

2.3 *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට හා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *වයස් සීමාව* :

අයදුම්කරුවන්, අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2001.01.20 වැනි දින හෝ ඊට පෙර හා 1987.01.20 වැනි දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට එම නිලධාරීන් යටත් වේ.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.

(iii) පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර I වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

(iv) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට අනුශංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

(v) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද 2013.09.26 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා

ගැනීම් පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් කම්කරු නිලධාරී තනතුරේ II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(vi) තෝරාගනු ලබන අපේක්ෂකයන් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(vii) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

05. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු. 34,605 - 10 x 660 - 11 x 755 - 15 x 930 - රු. 63,460 මාසික වැටුප් පරිමාණයක් හිමි ය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN - 05- 2016 වැටුප් කාණ්ඩය)

06. *ලිඛිත විභාගය :*

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. රචනය හා සාරාංශය | පැය 03 | 100 | 40 |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

අපේක්ෂකයන් විසින් සියලු ම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා වූ අපේක්ෂකයන් පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාව ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

07. ලිඛිත විභාගය පහත විෂය නිර්දේශය යටතේ පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. රචනය හා සාරාංශය | දේශීය හා විදේශීය වශයෙන් වැදගත් දේශපාලන, ආර්ථික හා සමාජයීය වෙනස්කම් පිළිබඳ කාලීන තොරතුරු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා තීරණ ගැනීමේ හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |

08. *සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

*සැලකිය යුතුයි :*

සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

09. *විභාග කොන්දේසි :*

i. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතුය.

ii. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊමේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදුකරනු

ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. විභාග ගාස්තුව රු. 600 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාගෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) මාර්ගගත ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති හර කාඩ්පතක් මගින් (Debit card with online payment facility)
(iii) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මගින් (Online Banking Method, Bank of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Slip Payment, Bank of Ceylon)
(v) තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at a Post office )

***සටහන 2 :***

ඉහත ක්‍රමය මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

iv. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රමය මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

v. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ සිදු කරනු නොලැබේ.

vi. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථාවක සේවයේ නියුතු අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

***සටහන 3 :***

ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

vii. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට අයදුම්පතේ මුද්‍රිත පිටපත එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2 හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් එලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය පැවැත්වීමට නියමිත දිනට, දින කීපයකට පෙර විභාග ප්‍රවේශපත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරන අතර අයදුම්කරුවන්ට එය බාගත කර ගැනීමේ පහසුකම ද සපයා දේ.

viii. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

ix. විභාගය පැවත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

x. විභාග අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

xi. *ප්‍රතිඵල නිකුත් කිරීම* :

ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයෙන් ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීම හෝ සිදු කරනු ඇත.

*සටහන 4* :

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැලකිය යුතුය.

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ඇත.

11. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය *ගැසට් නිවේදනයට* අනුව කටයුතු කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ - 05.

2021 දෙසැම්බර් මස 06 වැනි දින.

12-401

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.